# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 2008 ඔක්තෝබර් මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 ඔක්තෝබර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 18.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 2008 ඔක්තෝබර් මස 23 වන දින]

එල්. ඩී.— ඕ. 37/2006.

නාගරික ජනාවාස සංවර්ධනයට අදාළ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියක් පිහිටුවීම සඳහා ද,; තිරසාර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇතිවන බවට සහතිකවීම පිණිස දැනට පවතින නිවාස ඒකක වැඩි දියුණු කිරීම මගින් හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් සහ අවම නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය සැලසීම මගින් සේවා පහසුකම් අඩු නාගරික ජනාවාසවල වෙසෙන තැනැත්තන්ගේ ජීවන තත්ත්ව නගාසිටුවීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

## I වන කොටස

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය

2. (1) (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය නම් වූ ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවීම.

(2) (1) වන උපවගන්තිය මගින් අධිකාරියට වෙන් කර දී ඇති නාමයෙන් එය සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, එකී නාමයෙන් අධිකාරිය විසින් ද ඊට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ ප්‍රධාන කාර්යාලය කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා තිබිය යුතු ය.

2—PL 003093—3,500 (2008/07)

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය.

3. අධිකාරියේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය (මෙහි මින් මතු ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු අතර, එම අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත් වන සාමාජිකයන්, එනම් :—

(i) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක් ;

(ii) පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක් ;

(iii) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ නාගරික සංවර්ධන අධිකාරියේ තත්කාලයෙහි සභාපතිවරයා වශයෙන් ධුරය දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයෙක් ;

(iv) 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා වශයෙන් තත්කාලයේ ධුරය දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයෙක්;

(ආ) (මෙහි මින් මතු ''පත් කළ සාමාජිකයන්'' යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින්, ප්‍රමාණවත් ස්ත්‍රී පුරුෂ නියෝජනයක් ඇති බවට සහතික කරමින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන් ;

(i) නාගරික ප්‍රදේශයන්හි පළාත් පාලන ආයතනවල අයිතිවාසිකම් නියෝජනය කිරීම සඳහා සාමාජිකයන් තිදෙනෙක් ;

(ii) නාගරික ජනාවාස සංවර්ධනය පිළිබඳ දැනුම සහ පළපුරුද්ද ඇති බවට අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතරින් සාමාජිකයන් සිව් දෙනෙක්.



සාමාජිකයකු ලෙස පත් කිරීම පිළිබඳ නුසුදුසුකම්.

4. යම් තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු වේ නම් හෝ වන්නේ නම් ;

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකු වීම නැවතී ඇත්නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බව දැන ගැනීමට තිබේ නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ සිටී නම් ;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත්ව සිටී නම් හෝ යටත්ව සිටියේ නම් ;

(ඉ) අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් ඇති කර ගත් යම් ගිවිසුමක් යටතේ ඔහු යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම් ; හෝ

(ඊ) අධිකාරියේ සාමාජිකයකු ලෙස සිය කටයුතු ඉටු කිරීමේ දී ඊට බලපෑමක් සිදු විය හැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඔහුට ඇත්නම්,

ඒ තැනැත්තා සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීම සඳහා හෝ එලෙස තවදුරටත් කටයුතු කිරීම සඳහා හෝ සුදුස්සෙක් නොවිය යුතු ය.

සාමාජිකයන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම.

5. (1) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර එම ලිපිය අමාත්‍යවරයා විසින් භාර ගනු ලබන දිනයේ සිට එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් හේතු දක්වා මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ පත් කළ සාමාජිකයකු මියයන හෝ ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන අවස්ථාවක 3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා ඔහු වෙනුවට වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ පත් කළ සාමාජිකයකු තමා අනුප්‍රාප්තිකයා වන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

6. (5) වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු අතර, එම සාමාජිකයා නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික හෝ දීමනා.

7. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණ අනුව මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික හෝ දීමනා ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා.

8. (1) මණ්ඩලයේ පත් කළ සාමාජිකයන් අතරින් අමාත්‍යවරයා විසින් සභාපතිවරයකු පත් කරනු ලැබිය හැකි ය.

(2) සභාපතිවරයාගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු අතර, ඔහු නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(3) රෝගාතුර වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිවරයාට තාවකාලිකව තම ධුරයේ කටයුතු ඉටු කළ නොහැකි නම් අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුගේ ධුරයේ සාමාන්‍ය කටයුතුවලට අමතරව සභාපතිවරයාගේ තනතුරේ වැඩ බැලීම සඳහා මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව සභාපතිවරයා තම ධුරයේ කටයුතුවලට පිටතින් මුදල් ගෙවන යම් රැකියාවක නියුක්ත නොවිය යුතු ය.

(5) සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ලිපිය අමාත්‍යවරයා විසින් භාර ගනු ලබන දිනයේ සිට එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(6) අමාත්‍යවරයා විසින් හේතු දක්වා සභාපතිවරයා එම ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.



(7) (5) වන සහ (6) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාල සීමාව විය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම.

9. (1) සභාපතිවරයා, මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණ සිටී නම්, ඔහු ඒ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටී නම් පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(2) අධිකාරියේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(3) සභාපතිවරයාට හෝ අධිකාරියේ යම් රැස්වීමක මුලසුන දරන වෙනත් සාමාජිකයකුට, තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධානවලට යටත්ව, අධිකාරිය විසින් අධිකාරියේ රැස්වීම්වලට අදාළ කාර්ය පටිපාටිය සහ එම රැස්වීම්වල කටයුතු කරගෙන යාමේ කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය යුතු ය.

උපදේශක කමිටුවක පිහිටුවීම.

10. (1) "උපදේශක කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන කමිටුවක් අධිකාරිය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී වැඩ සටහන්වලට අදාළ යම් කාරණාවක් අනුමත කිරීමේ දී සහ ඒ සම්බන්ධව කටයුතු කිරීමේ දී අධිකාරිය විසින් උපදේශක කමිටුවේ උපදෙස් ලබා ගත හැකි ය.

(3) ප්‍රමාණවත් ස්ත්‍රී, පුරුෂ නියෝජනයක් ඇති බවට සහතික වෙමින් උපදේශක කමිටුව සභාපතිවරයකුගෙන් සහ සාමාජිකයන් දාහතර දෙනෙකුට වැඩි නොවන පිරිසකගෙන් සමන්විත විය යුතු ය.

(4) මණ්ඩලය විසින් ඊට අදාළ රීති සෑදිය යුතු අතර, එහි කර්තව්‍ය තීරණය කරනු ලැබිය යුතු ය.

පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා ක්‍රියා අවලංගු නොවිය යුතු බව.

11. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා හෝ අධිකාරියේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව.

12. (1) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කොට සාදනු ලැබිය යුතු අතර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට එය වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන යම් තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

(3) මණ්ඩලයේ අනුමතය ඇතිව හැර සහ සභාපතිවරයා සහ එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර අධිකාරියේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර. තමා පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් සභාපතිවරයා සහ එම සාමාජිකයා සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය:

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අධිකාරියේ මුද්‍රාව තබනු ලබන විට, සභාපතිවරයාට පැමිණ සිටීමට නොහැකි වන අවස්ථාවක දී, මේ උපවගන්තියේ ඉහතින් ම වූ විධිවිධානවලට අනුකූලව එම සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් තැබීමට සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ වෙනත් යම් සාමාජිකයකුට බලය තිබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබා ඇති ලේඛන සහ සාධන පත්‍රවල ලේඛනයක් අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු ය.

අමාත්‍යවරයාගේ විධානය යටතේ මණ්ඩලය විසින් සිය බලතල ක්‍රියාත්මක කළ යුතු බව.

13. මණ්ඩලය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අමාත්‍යවරයා විසින් මණ්ඩලය වෙත කලින් කල නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය:

එසේ වුව ද, එසේ නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධානවලට මණ්ඩලය විසින් අනුකූලව ක්‍රියා කිරීම තත්කාලයෙහි බලපවත්නා වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව සිදු විය යුතු ය.



මණ්ඩලයේ බලතල සහ කර්තව්‍ය පැවරීම.

14. (1) මණ්ඩලය විසින් ස්වකීය බලතල සහ කර්තව්‍යවලින් යම් බලතල සහ කර්තව්‍ය සභාපතිවරයා වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ බලතල සහ කර්තව්‍ය පවරනු ලැබූ සභාපතිවරයා විසින් අධිකාරියේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව එසේ පවරනු ලැබූ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

අධිකාරියේ බලතල සහ කර්තව්‍ය.

15. අධිකාරියේ බලතල සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) නාගරික ජනාවාසවල ජීවන තත්ත්ව නගාසිටුවීම සඳහා නාගරික ජනාවාසවල ජීවත් වන ජනතාවගෙන් ලැබිය හැකි යෝජනා, සැලසුම්වලට ද නිසි සැලකිල්ල ලබා දීමෙන් පසු, යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාවේ යෙදවීම ;

(ආ) හැකි සෑම අවස්ථාවකම අදාළ ජන කොටස් ඉතා උසස් මට්ටමකින් යොදා ගනිමින් නාගරික ජනාවාසවල ජීවන තත්ත්ව නගාසිටු වන සංවර්ධන වැඩවලට අදාළ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඇ) නිවාස ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ;

(ඈ) ආණ්ඩුවේ මුදල් කාර්ය පටිපාටියට යටත්ව, පැල්පත් හා මුඩුක්කුවල වාසය කරන තැනැත්තන්ගේ නිවාසවල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා එම තැනැත්තන්ට මුදල් ප්‍රදානයන් ලබා දීම;

(ඉ) පළාත් පාලන ආයතනවල සහ ප්‍රදේශයේ ජන කොටස්වල සහ ආයතනවල හවුල් ව්‍යාපාරයක් ලෙස නාගරික ජනාවාසවල නිවාස, යටිතල පහසුකම් සහ සේවා අවශ්‍යතා ද නාගරික පදිංචිකරුවන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වය ද හඳුනා ගැනීම සඳහා පළාත් පාලන ආයතනවල සහ ප්‍රදේශයේ ජන කොටස්වල සහ ආයතනවල හවුල් ව්‍යාපාරයක් ලෙස සමීක්ෂණ හා අධ්‍යයන පැවැත්වීම සහ එම තොරතුරු පිළිබඳ දත්ත මූලාශ්‍රයක් සකස් කර ඒවා නිතිපතා යාවත්කාලීන කිරීම ;

(ඊ) ආණ්ඩුව විසින් අනුමත කරන ලැබූ නාගරික නිවාස සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට භාර ගැනීම ;

(උ) මුඩුක්කු සහ පැල්පත් නිවාසවල වෙසෙන ප්‍රජාවගේ තත්ත්වය උසස් කිරීම සඳහා කටයුතු කිරීම සහ එවැනි ජනාවාස ප්‍රදේශ සංවර්ධනය කිරීම උදෙසා වැඩ කිරීම ;

(ඌ) නේවාසික ජනතාවට ප්‍රතිලාභ ලබා දීම සඳහා අදහස් කරනු ලබන නිවාස සහ ජනාවාස ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී පළාත් පාලන ආයතනවල සහ ප්‍රදේශයේ ජන කොටස්වල සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සහ ඒවා ලබා ගැනීම ;

(එ) දැනට බලපවත්නා ජාතික ප්‍රතිපත්තියේ ව්‍යුහය ඇතුළත ජනාවාස සංවර්ධනය සඳහා සැලසුම් කළ නාගරික ඉඩම්වල ජනතාව පදිංචි කරවීම සඳහා සහ ඔවුන් තෝරා ගැනීම සඳහා අවශ්‍ය සියලු පියවර ක්‍රියාත්මක කිරීම ;

(ඒ) නාගරික ජනාවාස සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවේ යෙදවීම සඳහා යම් තැනැත්තකු සමඟ යම් ගිවිසුමකට ඇතුළත් වීම ;

(ඔ) ඉදිකිරීම්, ඉංජිනේරු වැඩ සහ වෙනත් මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය හා සම්බන්ධ යම් වැඩක් භාර ගැනීම සහ නාගරික සේවා සැපයීම ;

(ඕ) යම් නාගරික ජනාවාස ප්‍රදේශයක ප්‍රජාවගේ සාමාන්‍ය සුභසිද්ධිය සහ සමාජ සහ සංස්කෘතික දියුණුව වැඩි දියුණු කිරීම සහ එම ප්‍රදේශයේ කටයුතු පරිපාලනය කිරීම ;

(ක) යම් නාගරික ජනාවාස ප්‍රදේශයක ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමේ දී පෞද්ගලික ප්‍රාග්ධනය යොදා ගැනීම, ප්‍රවර්ධනය කිරීම සහ ලබා ගැනීම ;

(ග) අධිකාරිය විසින් අත්කරගනු ලබන හෝ දරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, ලබා



ගැනීම හෝ බද්දට හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ එවැනි දේපළක් අන්‍යාකාරයකින් බැහැර කිරීම; මුඩුක්කු හෝ පැල්පත් වාසීන්ගේ නිවාස තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා මේ පනතේ වෙනත් යම් විධිවිධානවලට යටත්ව යම් නිශ්චල දේපළක නිදහස් අයිතිය එම තැනැත්තන්ට ප්‍රදානය කිරීම ;

(ඛ) අධිකාරිය විමසා හෝ එහි සහභාගීත්වය ඇතිව නාගරික ජනාවාස සංවර්ධන ව්‍යාපෘති භාර ගැනීම සඳහා රජයේ යම් නියෝජ්‍ය ආයතනයකින් හෝ පෞද්ගලික ආයතනයකින් ඉල්ලා සිටීම ;

(ජ) අධිකාරිය වෙත සතු කර ඇති හෝ ඊට අයත් ඉඩම්, මහල් නිවාස, නිවාස සහ වෙනත් වාසස්ථාන පහසුකම් සහ ගොඩනැගිලි හෝ වෙනත් දේපළ කළමනාකරණය කිරීම ;

(ට) යම් ගොඩනැගිල්ලකින්, මහල් නිවාසයකින්, නිවාසයකින් හෝ වෙනත් වාසස්ථාන පහසුකමකින් හෝ අධිකාරිය විසින් සපයනු ලබන යම් සේවා හෝ පහසුකම් සඳහා කුලී හෝ ගාස්තු අය කිරීම ;

(ඩ) නාගරික පදිංචිකරුවන්ට මහල් නිවාස, නිවාස හෝ වෙනත් වාසස්ථාන පහසුකම් මිල දී ගැනීම සඳහා අධීක්ෂණය කරනු ලැබීමට යටත් ණය යෝජනා ක්‍රම ලබා දීම සහ කළමනාකරණය කිරීම ;

(ණ) මුදලින් හෝ අන්‍යාකාරයකින් ශ්‍රී ලංකාව ඇතුළතින් හෝ ඉන් පිටතින් ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග හෝ සහනාධාර භාර ගැනීම සහ අධිකාරියේ යම් අරමුණක් ඉටු කර ගැනීම සඳහා ඒවා යොදා ගැනීම ;

(ත) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සහ අධිකාරිය විසින් තීරණය කරනු ලබන නියම මත සෘණ පත්‍ර, ස්කන්ධ, බැඳුම්කර, උකස්කිරීම් හෝ වෙනත් සුරැකුම්පත් නිකුත් කිරීම මගින් ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටවලින් මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම හෝ බැඳීම් ඇති කර ගැනීම ; සහ

(ද) රාජ්‍ය හෝ රාජ්‍ය නොවන වෙනත් ආයතන සමඟ හවුල් ව්‍යාපාරවලට ඇතුළත් වීම සහ අධිකාරියේ කර්තව්‍යවලින් යම් කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා පාලිත ආයතන පිහිටුවීම.

## II වන කොටස

### මුදල්

අධිකාරියේ අරමුදල.

16. (1) අධිකාරියට එහිම අරමුදලක් තිබිය යුතු ය. අධිකාරියේ අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු ය :—

(අ) අධිකාරියේ පරිහරණය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කර ගනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් ;

(ආ) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් ;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත යම් ප්‍රභවයකින්, ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් ;

(ඈ) අධිකාරිය වෙත සතු වූ හෝ අධිකාරිය විසින් පරිපාලනය කරනු ලබන යම් දේපළකින් අධිකාරියට ලැබෙන සියලු ආදායම් ;

(ඉ) අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපළ සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කර ගනු ලබන සියලු මුදල් ; සහ

(ඊ) අධිකාරිය විසින් සපයනු ලබන සේවා සඳහා අධිකාරිය වෙත උපචිත වන සියලු ආදායම්.

(2) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අධිකාරියට දැරීමට සිදු වන යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් අරමුදලින් දරනු ලැබිය යුතු ය.

(3) අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් මිලියන පන්දහසක් විය යුතු ය. ආරම්භක ප්‍රාග්ධන මුදල, අමාත්‍යවරයා විමසා මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එම මුදල් (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.



මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

17. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අධිකාරියේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම සහිතව, අධිකාරියේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ණය ගැනීමේ බලතල.

18. (1) අධිකාරියේ වගකීම් ඉටු කිරීම සඳහා හෝ මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීම සඳහා හෝ මණ්ඩලයට අවශ්‍ය වන මුදල් අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙනු ලබන යම් සාමාන්‍ය බලයක් ප්‍රකාරව මණ්ඩලය විසින් තාවකාලිකව ණයට ගනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ලබා ගන්නා ලද තාවකාලික ණය මුදල් කිසිවක් සම්බන්ධයෙන් ගෙවීමට තිබෙන මුදල්වල එකතුව, කවර හෝ අවස්ථාවක දී, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදලක් නොඉක්මවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තාවකාලික ණය වශයෙන් දෙනු ලබන ණය හැර, අධිකාරියේ ක්‍රියාකාරී ප්‍රාග්ධනය සැපයීම සඳහා මණ්ඩලය විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන කැමැත්ත සහිතව සෲණපත්‍ර නිකුත් කිරීම මගින්, මුදල් ණයට ගනු ලැබිය හැකි ය. එසේ ඇති කරනු ලබන සහ නිකුත් කරනු ලබන සෲණපත්‍ර "නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී සෲණපත්‍ර" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(3) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන කැමැත්ත සහිතව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කොන්දේසිවලට අනුකූලව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සෲණපත්‍ර නිකුත් කිරීම, මාරු කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, මුදා ගැනීම සහ අවලංගු කිරීම කරනු ලැබිය යුතු ය.

(4) අධිකාරිය විසින් නිකුත් කරනු ලබන සෘණපත්‍ර මත හෝ අධිකාරිය විසින් ලබා ගන්නා ලද ණය මුදල් මත මුල් මුදල ආපසු ගෙවීම සම්බන්ධයෙන් සහ ඒ මුදල මත පොළිය ගෙවීම සම්බන්ධයෙන් ද මුදල් විෂයය භාර අමාත්‍යවරයා ඇප විය යුතු ය.

## III වන කොටස

### අධිකාරියේ කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම.

19. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු සිටිය යුතු අතර, ඔහු අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා ඡන්දය පාවිච්චි කිරීමේ අයිතියක් නොමැතිව මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා, සභාපතිවරයාගේ සාමාන්‍ය සහ විශේෂ විධානවලට සහ පාලනයට යටත්ව, අධිකාරියේ කටයුතු මෙහෙය වීම, අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම, සංවිධානය කිරීම සහ අධිකාරියේ සේවා නියුක්තයන්ගේ පරිපාලනය භාරව සිටිය යුතු ය.

(3) මණ්ඩලයේ අනුමතය ඇතිව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කල අවශ්‍ය යයි සලකනු ලබන ඔහුගේ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය අධිකාරියේ යම් සේවා නියුක්තයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි අතර එසේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය පවරනු ලැබූ යම් සේවා නියුක්තයකු විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයට යටත්ව ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් පත් කිරීම.

20. (1) අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලබන නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි අතර අධිකාරිය විසින් අධිකාරියේ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කළ හැකි ය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අධිකාරිය විසින් නිශ්චිය කරනු ලැබිය හැකි වූ අනුප්‍රමාණ අනුව අධිකාරියේ නිලධරයන්ට, සේවකයන්ට සහ අනුයෝජිතයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතු අතර, අධිකාරිය නිශ්චය කරනු ලැබිය හැකි සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.



අධිකාරියේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන්, පළාත් පාලන සේවයේ නිලධරයන් පත් කිරීම.

21. (1) මණ්ඩලයේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ එම නිලධරයාගේ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් රාජ්‍ය සංස්ථාවක නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත ඇතිව අර්ථසාධක අරමුදලට සම්බන්ධ අයිතිවාසිකම් ද ඇතුළුව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩලයේ සාමාජිකයන් විසින් එකඟ විය හැකි නියම සහ කොන්දේසි මත, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(5) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇත්තා වූ ද එමගින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත් වී ඇත්තා වූ ද යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, එම තැනැත්තා විසින් අධිකාරියට කරනු ලබන යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ වගකීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) අධිකාරියේ ඉල්ලීම පරිදි, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක වෙනත් යම් සේවා නියුක්තයකු අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ, සේවා නියුක්තයාගේ සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ හෝ ඒ

පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව අධිකාරිය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියම සහ කොන්දේසි ඇතුළුව අධිකාරිය සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාව හෝ අදාළ පළාත් පාලන ආයතනය එකඟ විය හැකි නියම සහ කොන්දේසි මත ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(7) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් සේවා නියුක්තයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට (6) වන උපවගන්තිය යටතේ තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, එම කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු ද යටත් විය යුතු ය.

(8) අධිකාරියේ ඉල්ලීම පරිදි යම් රාජ්‍ය සංස්ථාවක යම් සේවා නියුක්තයකු එම සේවා නියුක්තයාගේ සහ එම සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව අධිකාරිය විසින් එවැනිම කැමැත්ත ඇතිව තීරණය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා අධිකාරියෙහි කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියම හා කොන්දේසි ඇතුළුව අධිකාරිය සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය එකඟ විය හැකි නියම සහ කොන්දේසි යටතේ අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

## IV වන කොටස

## නිශ්චල හා චංචල දේපළ අත්කර ගැනීම සහ අධිකාරියට අයත් ඉඩම් විකිණීම

පළාත් පාලන ආයතනයකට හෝ රාජ්‍ය සංස්ථාවකට අයත් දේපළ අත්කර ගැනීම.

22. (1) යම් පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය සංස්ථාවක් වෙත පවරා දී ඇති යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවක් අධිකාරියේ යම් කාර්යයක් සඳහා අධිකාරියට අවශ්‍ය බවට අමාත්‍යවරයා විසින් සහතික කරනු ලබන අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් එම නියමයේ දැක්විය යුතු දිනයක සිට බලපැවැත්වෙන පරිදි සහ එම නියමයේ සඳහන් යම් කොන්දේසි ඇත්නම් එම කොන්දේසිවලට යටත්ව එම ඉඩම හෝ ඉඩමේ සම්බන්ධතාවය අධිකාරිය වෙත පවරා දෙනු ලැබිය හැකි ය.



(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චිතව දැක්වෙන යම් ඉඩමක හෝ එම ඉඩමේ සම්බන්ධතාවයක සහ එම ඉඩම මත පිහිටි ගොඩනැගිලි සහ වෙනත් ව්‍යුහවල පරම අයිතිය, එම නියමයේ නිශ්චිතව සඳහන් දිනයක සිට බලපවත්වන පරිදි සියලු බැඳීම්වලින් තොරව, අධිකාරිය වෙත පවරනු ලැබිය යුතු අතර එම ඉඩම හෝ එම ඉඩමේ සම්බන්ධතාවය හෝ එහි ඇති ගොඩනැගිලි හෝ ව්‍යුහ සම්බන්ධයෙන් කිසිදු වන්දි මුදලක් අධිකාරිය විසින් ගෙවනු නොලැබිය යුතු ය.

(3) අදාළ පළාත් පාලන ආයතනයේ එකඟත්වය ඇතිව පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් දෙනු ලබන කැමැත්ත නොමැතිව හෝ ඒ රාජ්‍ය සංස්ථාවේ කැමැත්ත නොමැතිව, (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින්, යම් පළාත් පාලන ආයතනයක හෝ රාජ්‍ය සංස්ථාවක යම් නිශ්චල දේපළක් සඳහා බලපාන්නා වූ කිසිම නියමයක් කරනු නොලැබිය යුතු ය.

රජයේ ඉඩම අධිග්‍රහණය කිරීම.

23. (1) රජයේ යම් නිශ්චල දේපළක් අධිකාරියේ කටයුතුවල කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ අවස්ථාවක දී, එම කාර්ය (454 වන අධිකාරිය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ එම දේපළ විශේෂ ප්‍රදානයක් හෝ බදු දීමක් ලෙස දිය යුතු කාර්යයක් සේ සැලකිය යුතු අතර, අධිකාරිය වෙත එම දේපළ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් ලෙස දීමේ දී ඒ අනුව, එම ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) රජයේ දෙපාර්තමේන්තුවක හෝ යම් රාජ්‍ය සංස්ථාවක යම් චංචල දේපළක් අධිකාරියේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ අවස්ථාවක දී, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් එකී චංචල දේපළෙහි සන්තකය සහ භාවිතය අධිකාරිය වෙත පවරා සතු කරනු ලැබිය හැකි ය.

(3) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් භාර අමාත්‍යවරයාගේ කැමැත්ත නොමැතිව (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින්, ඒ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ හෝ රාජ්‍ය සංස්ථාවේ යම් චංචල දේපළකට බලපාන්නා වූ කිසිම නියමයක් කරනු නොලැබිය යුතු ය.

1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත අදාළ වීම.

24. නාගරික සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විසින් කරනු ලබන නිර්දේශයක් මත, මහජනතාවගේ සාධාරණ පොදු සුහසාධන අවශ්‍යතා ඉටු කරනු ලබන නාගරික ජනාවාස සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ගෙන යාමේ කාර්යය සඳහා යම් නාගරික ප්‍රදේශයක

පිහිටි යම් නිශ්චිත ඉඩමක් වහා අවශ්‍ය බවට ජනාධිපතිවරයාගේ මතය වන අවස්ථාවක දී, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් ඒ නාගරික ප්‍රදේශයේ පිහිටි ඒ ඉඩම ඒ කාර්යය සඳහා අවශ්‍ය බව ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය. 1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන, මේ වගන්තිය ප්‍රකාර ඉඩමක් අත්කර ගැනීම සඳහා හා ඒ හා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ විය යුතු ය.

ඉඩම් අත්පත් කර ගැනීමේ පනත අදාළ වීම.

25. නාගරික ප්‍රදේශයක පිහිටි යම් ඉඩමක් හෝ ඉඩමක යම් සම්බන්ධතාවක් අධිකාරියේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක දී, එම ඉඩම හෝ එහි යම් සම්බන්ධතාවය (460 වන අධිකාරය වූ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ ආණ්ඩුව විසින් හෝ අධිකාරිය විසින් අත්කර ගනු ලැබිය හැකි අතර ඒ ඉඩම හෝ එහි සම්බන්ධතාවය අත්පත් කර ගැනීමේ කාර්ය සඳහා ඒ පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ විය යුතු ය. ඒ ඉඩම හෝ එහි යම සම්බන්ධතාවය ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ කාර්යය සඳහා පොදු කාර්යයක් සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය යුතු ය.

දේපළ අන්සතු කිරීම.

26. (1) අධිකාරිය විසින් දරනු ලබන යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවක් හෝ ගොඩනැගිල්ලක් හෝ අධිකාරිය විසින් අන්සතු කරනු ලබන්නේ යම් ප්‍රයෝජනයක් හෝ ප්‍රයෝජන සඳහා ද ඒවා ඇතුළුව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් නියම හා කොන්දේසිවලට යටත්ව ඒ ඉඩම හෝ ඉඩමේ සම්බන්ධතාවය විකිණීම, බදු දීම, කුලියට දීම හෝ මිලයට ගැනීම මඟින්, අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ ලිඛිත අනුමතය ඇතිව අන්සතු කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, 1979 අංක 43 දරන ඉඩම් ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ හෝ (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධානවලට යටත්ව යම් ප්‍රදානයක් හෝ අවසර පත්‍රයක් මිඟින් යම් අන්සතු කිරීමක් සිදු කර ඇති අවස්ථාවක, එකී ප්‍රදානය හෝ අවසර පත්‍රය අවස්ථාවෝචිත පරිදි එකී පනතේ හෝ ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.



(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව—

(අ) ඒ සාධන පත්‍රයේ නිශ්චිතව දැක්වෙන වෙනත් යම් කොන්දේසියකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීමේ දී ;

(ආ) එම සාධන පත්‍රය යටතේ අධිකාරියට අය විය යුතු යම් මුදලක් එහි නිශ්චිතව දැක්වෙන යම් කාලසීමාවක් සඳහා නොගෙවා ඉතිරිව ඇති අවස්ථාවක ;

(ඇ) අධිකාරිය විසින් කරනු ලබන කොන්දේසි විරහිත විකිණීමක දී හැර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අවසරය නොමැතිව ඉඩම හෝ ඉඩමේ සම්බන්ධතාවය, ගොඩනැගිල්ල විකුණනු ලබන, තෑගි කරනු ලබන, බදු දෙනු ලබන හෝ අන්‍යාකාරයකින් අන්සතු කරනු ලබන අවස්ථාවක,

අන්සතු කිරීමේ සාධන පත්‍රය මගින් බලාත්මක කරනු ලැබූ අන්සතු කිරීම අවලංගු කිරීමට හෝ අවසන් කිරීමට ඒ අන්සතු කිරීමේ සාධන පත්‍රයේ විශේෂ කොන්දේසි තිබිය යුතු ය.

(3) යම් නාගරික නිවාස සංවර්ධන ව්‍යාපෘතියක කාර්යය සඳහා හෝ ඊට අදාළ කාර්යය සඳහා අධිකාරිය විසින් දරනු ලබන යම් රජයේ ඉඩමක් අන්සතු කිරීම සම්බන්ධයෙන් (454 වන අධිකාරිය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ සඳහන් කිසිවක් බල නොපෑ යුතු අතර එසේ බලපාන බවට සැලකීම හෝ තේරුම් ගැනීම නොකළ යුතු ය.

අධිකාරියට එරෙහිව කිසිදු නඩුවක් නොපැවරිය යුතු බව.

27. වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, 26 වන වගන්තියේ විධිවිධාන යටතේ අන්සතු කිරීමේ සාධන පත්‍රයක් අවලංගු කිරීම හෝ අවසන් කිරීම සම්බන්ධයෙන් අධිකාරියට හෝ එහි යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ අනුයෝජිතයකුට එරෙහිව කිසිදු නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

## V වන කොටස

## ණයවලට අදාළ විධිවිධාන

ණය.

28. මහල් නිවාසයක්, නිවාස ඒකකයක් හෝ වෙනත් වාසස්ථාන පහසුකමක් මිල දී ගැනීම හෝ ඉදිකිරීම සඳහා අධිකාරිය විසින් ප්‍රදානය කරනු ලබන සෑම ණය මුදලක් ම—

(අ) අධිකාරිය විසින් නිශ්චිතව දක්වනු ලබන ආකාරයට වාරික මගින් සහ එසේ දක්වනු ලබන කාල සීමාවක් ඇතුළත ; හෝ

(ආ) අධිකාරිය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් ආකාරයකට,

ගෙවනු ලැබිය යුතු ය.

දැන්වීම් භාර දීම.

29. (1) (අ) අධිකාරිය විසින් ණය මුදලක් ප්‍රදානය කරනු ලබන ;

(ආ) අධිකාරිය විසින් ණය මුදලක් ප්‍රදානය කර ඇත්තේ යම් තැනැත්තකුට ද එම තැනැත්තාගේ බූදලයේ තෙස්තමේන්තු නියාදනයක් මගින් ප්‍රොබේට් බලපත්‍රයක් ලබා ගන්නා ;

(ඇ) මියගිය ණයට ගත් තැනැත්තකුගේ බූදලය නියෝජනය කිරීම සඳහා 36 වන වගන්තිය යටතේ පත් කරනු ලබන ; හෝ

(ඈ) අධිකාරිය විසින් ප්‍රදානය කරන ලද ණය මුදලක ඇපයක් වශයෙන් අධිකාරිය වෙත උකස් කරනු ලැබූ යම් දේපළක යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් නැතහොත් එවැනි ණය මුදලක් සඳහා වූ වෙනත් යම් විස්තරයක ඇපයක් ස්වේච්ඡා පැවරීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් අත්වන්නා වූ,

සෑම තැනැත්තකු ම තමා වෙත එවිය යුතු සියලු දැන්වීම් එවිය හැකි ලිපිනයක් අධිකාරිය වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.



(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට යැවිය යුතු යම් දැන්වීමක් ඒ තැනැත්තා විසින් දැනුම් දී ඇති ලිපිනයට ඒ තැනැත්තා වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කරනු ලැබුවහොත් ඒ දැන්වීම ඒ තැනැත්තා වෙත නිසි පරිදි යවා ඇති බවට සලකනු ලැබිය යුතු ය. සාමාන්‍ය තැපෑලෙන් ලිපිය භාර දෙන වේලාවේ දී ඒ භාර දීම ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

ණය බේරුම් කිරීම.

30. (1) යම් දේපළක් ඇපයට තබා ගෙන අධිකාරිය විසින් ණය මුදලක් ප්‍රදානය කරනු ලැබූ විට අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අවසරය ඇතිව මිස සහ ඔහු විසින් පනවනු ලබන කොන්දේසිවලට අනුකූලව මිස ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තුරු එම දේපළ විකිණීම, තෑගි කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් අන්සතු කිරීම නොකළ යුතු ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද (1) වන උපවගන්තිය අදාළ වන යම් දේපළක් අන්සතු කිරීම හෝ සන්තකයෙන් බැහැර කිරීම ඒ උපවගන්තිය උල්ලංඝනය කරමින් සිදු කර ඇත්නම්, ඒ අන්සතු කිරීම හෝ සන්තකයෙන් බැහැර කිරීම වලංගු නොවිය යුතු අතර නීතියෙහි ලා බලාත්මක වීමක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අධිකාරිය විසින් ප්‍රදානය කරන ලද ණය මුදලක උකස සඳහා ප්‍රමුඛතාවය.

31. යම් දේපළක් උකස් කිරීම මත අධිකාරිය විසින් ණය මුදලක් ප්‍රදානය කරනු ලබන අවස්ථාවක, ඒ උකස ලියාපදිංචි කිරීමේ දිනයට පෙර යථා පරිදි ලියාපදිංචි කරන ලද උකසක් මත ලබා ගන්නා වූ ද, අධිකාරිය විසින් ණය මුදල ප්‍රදානය කිරීමට පෙර සද්භාවයෙන් අත්තිකාරම් වශයෙන් මුදල් ලබා දුන් ණය හිමියකුට අයවිය යුතු වූ ද ණය මුදලක් හැර, ඒ දේපළට බලපාන වෙනත් සෑම ණය මුදලකට, උකසකට හෝ ගාස්තුවකට වඩා ඒ උකස ලියාපදිංචි කිරීමේ දින සිට සහ එදිනට පසුව ණය මුදල සමඟ පොලිය දේපළෙන් අය කර ගැනීමට ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය.

ඉවමන් උකස් කිරීමේ ආකෘති පත්‍රය.

32. (1) යම් ණය මුදලක් සඳහා ඇප වශයෙන් අධිකාරියේ වාසියට ලියා අත්සන් කරන දේපළක සෑම උකසක් ම අධිකාරිය විසින් අනුමත කරනු ලබන යම් ආකෘති පත්‍රයක සාරානුකූලව විය යුතු ය.

(2) නියමිත දිනයේ දී පොළිය, මුල් මුදල හෝ උකස යටතේ අන්‍යාකාර වූ ගෙවීමක්, හෝ සම්පූර්ණයෙන් ගෙවීම ණය ගැනුම්කරු විසින් පැහැර හරිනු ලබන්නේ නම් හෝ අතපසු කරනු ලබන්නේ නම්, ණය මුදල ප්‍රදානය කරනු ලැබූ පොළී අනුපාතිකයට වඩා වැඩි පොළී අනුපාතිකයක් ගෙවනු ලැබිය යුතු බවට වූ ප්‍රතිඥාවක් (1) වන උපවගන්තියේ සඳහන් එවැනි යම් උකසකට ඇතුළත් විය හැකි ය.

ගෙවීම පැහැර හැරීම.

33. දේපළක් උකස් කිරීම මත ප්‍රදානය කරනු ලබන යම් ණය මුදලක් සම්බන්ධයෙන් අයවිය යුතු මුදල, මුල් මුදල මත හෝ පොලිය මත හෝ ඒ දෙකම මත අයවිය යුතු වුව ද, ඒ අයවිය යුතු මුදල ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක ඒ පැහැර හැරීම ණය මුදලේ නොගෙවා ඉතිරිව ඇති සම්පූර්ණ කොටස සම්බන්ධයෙන් සහ ඒ මත අයවිය යුතු පොලිය සම්බන්ධයෙන්, වූවාක් ලෙස සලකනු ලැබිය යුතු ය.

පැහැර හැරීම සඳහා ක්‍රියාමාර්ග.

34. යම් ණය මුදලක නොගෙවා ඉතිරිව ඇති සම්පූර්ණ කොටස සම්බන්ධයෙන් සහ ඒ මත අයවිය යුතු ණය මුදල සහ පොලිය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන යටතේ ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක හෝ ගෙවීම පැහැර හැර ඇති ලෙස සලකනු ලබන අවස්ථාවක, අධිකාරිය විසින් සිය අභිමතය පරිදි, ලිඛිත නියමයක් මගින්, ගෙවීම පැහැර හැර ඇති එම ණය මුදල සඳහා ඇප වශයෙන් අධිකාරියට උකස් කරනු ලැබූ යම් දේපළකට ඇතුළු වී එහි සන්තකය ලබා ගෙන ගෙවීම පැහැර හැර නොමැති නම් උකස්කරු විසින් එම දේපළ පාලනය සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන බලතල ම ක්‍රියාත්මක කිරීම සඳහා එම නියමයේ නිශ්චිතව යම් තැනැත්තකුට බලය පවරනු ලැබිය හැකි ය.

අධිකාරිය වෙත උකස් කරන ලද [illegible] විකිණීම.

35. 36 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අධිකාරිය විසින් ලිඛිත නියමයක් මගින්, විකිණීමේ දිනය දක්වා ඒ ණය මුදලේ නොගෙවා ඉතිරිව ඇති සම්පූර්ණ කොටස සහ එයට අයවන පොලිය 42 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු ද අයකර ගැනීම සඳහා, ගෙවීම පැහැර හැර ඇති ණය මුදල සඳහා ඇප වශයෙන් අධිකාරියට උකස් කරන ලද, යම් දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට, ඒ නියමයේ සඳහන් යම් තැනැත්තකුට බලය දෙනු ලැබිය හැකි ය.

ණය ගත් තැනැත්තා මියගිය අවස්ථාවක.

36. (1) (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි හැර, ණය ගැනුම්කරු මියයාම හෝ ණය මුදල සඳහා ඇප වශයෙන් ණය ගැනුම්කරු විසින් උකස් කරන ලද දේපළෙහි යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ස්වේච්ඡාවෙන් ඔප්පුවක් මගින් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් වෙනත් යම් තැනැත්තකුට පැවරී ඇත ද ඒ නොතකා ගෙවීම් පැහැර හැර ඇති අවස්ථාවක 34 හා 35 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.



(2) ණය ගැනුම්කරු මිය ගොස් ඇති අවස්ථාවක සහ ඔහුගේ අන්තිම කැමති පත්‍රයේ ප්‍රොබේට් බලපත්‍රය හෝ ඔහුගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය නිකුත් කරනු නොලැබූ අවස්ථාවක—

(අ) ණය මුදල සඳහා ඇප වශයෙන් ණය ගැනුම්කරු විසින් උකස් කරන ලද දේපළ පිහිටි දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය විසින්, අධිකාරිය තත්කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත සහ අධිකරණය විසින් ආඥා කරනු ලබන යම් තැනැත්තන් සිටී නම් ඔවුන් වෙත ඉල්ලීම පිළිබඳ දැන්වීම් භාර දීමෙන් පසු ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය නිකුත් කිරීම හෝ ප්‍රමාද විය හැකි බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම් මේ උපවගන්තියේ කාර්ය සඳහා ණය ගැනුම්කරුගේ බූදලය නියෝජනය කිරීම සඳහා යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය ; සහ

(ආ) මේ උපවගන්තිය යටතේ ණය ගැනුම්කරුගේ බූදලය පිළිබඳ නියෝජිතයකු පත් කරනු ලබන්නේ නම් මිස සහ එසේ පත් කරනු ලබන තුරු ණය ගැනුම්කරු විසින් කරනු ලබන ගෙවීම පැහැර හැරීමක් සම්බන්ධයෙන් 34 සහ 35 වන වගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

විකිණීම සඳහා වූ දැන්වීම පළ කිරීම.

37. (1) යම් දේපළක් විකිණීමට බලය පවරමින් 35 වන වගන්තිය යටතේ පළ කරනු ලබන සෑම නියමයක් පිළිබඳ දැන්වීමක්ම භාෂා තුනෙන් ම ගැසට් පත්‍රයේ සහ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළවන දිනපතා පුවත්පතක පළ කරනු ලැබිය යුතු අතර, ඒ දැන්වීමේ පිටපත් ණය ගැනුම්කරු ජීවත්ව සිටී නම් ඔහු වෙත සහ 29 වන වගන්තිය යටතේ එම දේපළ සම්බන්ධයෙන් තම ලිපිනය දැනුම් දී ඇති සෑම තැනැත්තකු වෙතම භාරදිය යුතු ය.

(2) ඒ දැන්වීමේ පිටපතක් භාර දීමට නියමිත යම් තැනැත්තකුගේ භාෂාව දෙමළ හෝ ඉංග්‍රීසි වන්නේ නම්, එවිට ඒ දැන්වීමේ පිටපතට අමතරව ඒ තැනැත්තාගේ භාෂාවෙන් යුක්ත වූ ඒ දැන්වීමේ පරිවර්තනයක් ඔහු වෙත භාරදිය යුතු ය.

විකිණීම පිළිබඳ දැන්වීම.

38. විකිණීම සඳහා නියම කර ඇති දිනයට දින දාහතරකට අඩු නොවන කාලයකට පෙර, ප්‍රකාශයට පත් කළ යුතු එවැනි සෑම

විකිණීමක ම දිනය, වේලාව සහ ස්ථානය පිළිබඳ දැන්වීම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම දැන්වීමේ පිටපත්—

(අ) ණය ගැනුම්කරු ජීවත්ව සිටී නම් ඔහු වෙත ද 37 වන වගන්තිය යටතේ විකිණීම සඳහා බලය පවරන නියමය පිළිබඳ දැන්වීම භාරදිය යුතු බවට නියම කර ඇති සෑම තැනැත්තකු වෙත ද භාර දිය යුතු ය ;

(ආ) විකිණීමට ඇති දේපළෙහි හෝ ඊට ආසන්නව ප්‍රදර්ශනය කළ යුතු ය ; සහ

(ඇ) ඒ දේපළ පිහිටා ඇත්තේ යම් ප්‍රාදේශීය සභාවක සහ ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් ඇතුළත ද, එම ප්‍රාදේශීය සභාවේ බිත්තිවල සහ ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත ඇලවිය යුතු ය.

විකිණීමට පෙර කරනු ලබන ගෙවීම.

39. (1) උකසේ නියමයන් ප්‍රකාරව නොගෙවා ඉතිරිව ඇති ණය මුදලේ සම්පූර්ණ කොටස සහ ඒ මත අයවිය යුතු පොළිය සහ 42 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් අයකර ගැනීමට ඇති මුදල් සහ ගාස්තු ඇත්නම් ඒවා ණය ගැනුම්කරු විසින් හෝ තත්කාර්ය සඳහා ණය ගැනුම්කරු විසින් බලය පවරනු ලැබූ තැනැත්තකු විසින්, ණය මුදල සඳහා ඇප වශයෙන් අධිකාරියට උකස් කරන ලද දේපළ විකිණීම සඳහා නියම කර ඇති දිනයට පෙර අධිකාරිය වෙත ගෙවනු ලැබුවහොත් ඒ දේපළ විකුණනු නොලැබිය යුතු අතර, ඒ දේපළ විකිණීම සඳහා 35 වන වගන්තිය යටතේ වූ නියමය ප්‍රකාරව තවදුරටත් කවර හෝ පියවරක් ගනු නොලැබිය යුතු ය.

(2) ගෙවීම පැහැර හැර ඇති වාරික මුදල හෝ වෙනත් මුදලක් සහ උකසේ නියමයන් ප්‍රකාරව ඒ මත අයවිය යුතු පොළිය සහ 42 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් අයකර ගැනීමට ඇති මුදල් සහ ගාස්තු ඇත්නම් ඒවා ණය මුදල සඳහා ඇප වශයෙන් අධිකාරියට උකස් කරන ලද දේපළ විකිණීම සඳහා නියම කර ඇති දිනයට පෙර ණය ගැනුම්කරු විසින් හෝ තත්කාර්ය සඳහා ණය ගැනුම්කරු විසින් බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් ගෙවනු ලැබුවහොත් අධිකාරිය විසින් එහි අභිමතය පරිදි ඒ දේපළ විකුණනු නොලැබිය යුතු බවට සහ ඒ දේපළ විකිණීම සඳහා 35 වන වගන්තිය යටතේ වූ නියමය ප්‍රකාරව තවදුරටත් කිසිවර හෝ පියවර ගනු නොලැබිය යුතු බවට විධාන කළ හැකි ය.



40. ණය මුදල් සඳහා ඇප වශයෙන් අධිකාරිය උකස් කරන ලද දේපළ අධිකාරිය හැර වෙනත් පුද්ගලයකුට විකුණනු නොලැබිය යුත්තේ යම් මුල් ලංසුවකට වඩා අඩුවෙන් ද එම මුල් ලංසුව අධිකාරිය විසින් නියම කළ හැකි ය. මුල් ලංසුවක් නියම කිරීම.

41. යම් ණය මුදලක් සඳහා ඇප වශයෙන් අධිකාරියට උකස් කරන ලද යම් දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ දී, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් ලිඛිතව බලය පවරන ලද යම් තැනැත්තකු විසින් හෝ අධිකාරිය සඳහා සහ එය වෙනුවෙන් ලංසු තබා ඒ දේපළ මිල දී ගත හැකි ය. අධිකාරිය වෙනුවෙන් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී ලංසු තැබීම.

42. (1) යම් ණය මුදලක් මත අයවිය යුතු මුදලට අමතරව ණය ගැනුම්කරුගෙන් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකුගෙන් අධිකාරිය විසින් පහත සඳහන් මුදල් අය කරගනු ලැබිය හැකි ය :— අධිකාරිය විසින් අය කරනු ලබන අතිරේක ගාස්තු.

(අ) අධිකාරිය වෙත උකස් කරන ලද දේපළ සම්බන්ධයෙන් ඇති කර ගත් යම් රක්ෂණ ඔප්පුවක් යටතේ ගෙවිය යුතු වාරික හා අයවිය යුතු ගාස්තු ගෙවීමේ දී ණය මුදල ගනු ලැබූ තැනැත්තා විසින් ලියා අත්සන් කරන ලද උකස් බැඳුම්කරයේ අන්තර්ගත වගන්තිවලට අනුකූලව අධිකාරිය විසින් වියදම් කරන ලද සියලු මුදල් සහ ඉහත කී උකස් බැඳුම්කරයේ අන්තර්ගත වගන්ති මගින් අධිකාරිය විසින් දැරිය යුතු බවට බලය පවරා ඇති වෙනත් සියලු වියදම් සහ ගාස්තු ; සහ

(ආ) විකිණීම පිළිබඳව ප්‍රචාරය කිරීමේ ගාස්තු සහ උකස් කරන ලද දේපළ විකිණීමේ ගාස්තු :

එසේ වුව ද, මේ උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ගාස්තු වශයෙන් අය කර ගනු ලබන මුදල් නියම කරනු ලැබිය හැකි ණය මුදලේ යම් ප්‍රතිශතයක් නොඉක්මවිය යුතු ය.

(2) අධිකාරිය වෙනුවෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උකස් කරන ලද දේපළ මිල දී ගනු ලබන අවස්ථාවක, (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් වියදම් ඔහු විසින් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, ඒ උපවගන්තිය යටතේ ණය ගැනුම්කරුගෙන් ඒ මුදල් සහ ගාස්තු අයකර ගැනීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ මුදල් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

අධිකාරියට අයවිය යුතු මුදල් අඩු කර ගැනීමෙන් පසු විකිණීමෙන් ලැබෙන මුදල්වල ඉතිරි මුදල ගෙවීම.

43. උකස් කරන ලද දේපළ විකුණනු ලැබූ අවස්ථාවක, උකස මත අයවිය යුතු මුදල සහ 42 වන වගන්තිය යටතේ අයකරගනු ලබන මුදල් සහ ගාස්තු, විකිණීමෙන් ලැබෙන මුදල්වලින් අඩු කිරීමෙන් පසු ඉතිරි වන මුදලක් ඇත්තේ නම් ණය ගැනුම්කරුට හෝ ඔහුට අයවිය යුතු ගෙවීම භාර ගැනීම සඳහා නීත්‍යානුකූලව හිමිකම් ඇති යම් තැනැත්තකුට හෝ ඒ මුදල ගෙවනු ලැබිය යුත්තේ කවරකුට ද යන්න පිළිබඳව අධිකාරියට සැකයක් ඇති විට ඊට හිමිකම් ඇති තැනැත්තාට ඒ මුදල ලබා ගත හැකි වන පරිදි ඒ දේපළ පිහිටා ඇත්තේ යම් දිසා අධිකරණයක අධිකරණ බලය ඇතුළත ද ඒ දිසා අධිකරණය වෙත හෝ ඒ මුදල ගෙවනු ලැබිය යුතු ය.

විකුණීම පිළිබඳ සහතිකය.

44. (1) උකස් කරන ලද දේපළ විකුණනු ලැබූ අවස්ථාවක, අධිකාරිය වෙනුවෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විකුණුම් සහතිකයක් අත්සන් කළ යුතු අතර, ඉන්පසු දේපළට සහ දේපළ සම්බන්ධයෙන් ණය ගැනුම්කරුට තිබූ සියලු අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතාව මිල දී ගත් තැනැත්තා වෙත සතු විය යුතු අතර, ඉන්පසු අධිකාරියට දේපළ උකස් කිරීමෙන් අනතුරුව ණය ගැනුම්කරුගේ අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පිළිබඳව කරන ලද කවර හෝ යම් නියාදනයක් යටතේ හිමිකම්පාන තැනැත්තකු විසින් අධිකාරිය වෙත දේපළ උකස් කිරීමේ දිනයට පසු කවර හෝ හේතුවක් නිසා දේපළ විකිණීම අවලංගු කිරීම සඳහා යම් අධිකරණයකින් ඉල්ලා සිටීම හෝ මිල දී ගත් තැනැත්තාට එරෙහිව එම දේපළ පිළිබඳ යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පවත්වාගෙන යාම සඳහා හෝ එම තැනැත්තාට බලයක් නොතිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය වෙනුවෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් කරනු ලබන විකුණුම් සහතිකයක්, යම් දේපළක් විකිණීමට අදාළව මේ කොටසේ ඇති සියලු විධිවිධානවලට අනුකූලව කටයුතු කර ඇති බවට එම දේපළ විකිණීම සම්බන්ධයෙන් නිරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

(3) විකුණුම් සහතිකය අධිකාරිය විසින් අනුමත කරනු ලැබිය හැකි ආකෘතියට අනුව විය යුතු ය.

නඩු ආදිය තහනම් කිරීම.

45. උකස් කරන ලද දේපළ විකුණනු ලැබූ අවස්ථාවක, කවර හෝ හේතුවක් නිසා විකිණීම අවලංගු කිරීමේ කාර්යය සඳහා හෝ මිල දී ගන්නාට එරෙහිව ඒ දේපළට හෝ ඒ සම්බන්ධයෙන් යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පවත්වාගෙන යාම



සඳහා හෝ විකිණීමේ දිනයට පසු මාස තුනක් ගතවීමෙන් පසු කිසිදු නඩුවක් හෝ නීති කෘත්‍යයක් යම් අධිකරණයක ආරම්භ නොවිය යුතු අතර, 46 වන වගන්තිය යටතේ මිල දී ගන්නා විසින් අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් විත්තිවාචකයක් සකස් කරනු නොලැබිය යුතු ය.

46. (1) මේ කොටසේ ඉහතින් ම වූ විධිවිධාන ප්‍රකාරව විකුණනු ලැබූ යම් දේපළක් මිල දී ගන්නා විසින් ඒ දේපළ පිහිටි ස්ථානය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත සහ 44 වන වගන්තිය යටතේ ඒ දේපළ සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ විකුණුම් සහතිකයක සහතික පිටපතක් ඉදිරිපත් කිරීම මත, එම දේපළේ හිස් සන්තකය ලබා ගැනීම සඳහා ආඥාවක් ලබා ගැනීමට ඒ මිල දී ගන්නාට හිමිකමක් තිබිය යුතු ය.

සන්තකය භාරදීම සඳහා වූ ආඥාව.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් ම පෙත්සමක සහ දිවුරුම් පෙත්සමක ආකාරයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඊට 44 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ දේපළ විකුණුම් සහතිකයේ සහතික පිටපතක් අමුණා තිබිය යුතු අතර, ඒ ඉල්ලීමේ කාර්ය උදෙසා ද අධිකාරිය සඳහා සහ එය වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තකු හැර වෙනත් තැනැත්තකු විසින් ඒ උපවගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන් පවත්වනු ලබන සියලු කාර්යය පටිපාටීන්වල කාර්යය උදෙසා ද තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු මුද්දර ගාස්තු සහ වෙනත් අයකිරීම් ගෙවනු ලැබිය යුතු අතර, එකී මුද්දර ගාස්තු සහ අනෙකුත් අයකිරීම් තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු අනුප්‍රමාණ අනුව විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මත දිසා අධිකරණය විසින් අදාළ දේපළෙහි සන්තකය මිල දී ගත් තැනැත්තාට භාර දෙන ලෙස වහාම ආඥා කළ යුතු අතර, සන්තකය ලබා ගැනීමේ රිට් ආඥාවක් අධිකරණය විසින් ඒ අධිකරණයේ පිස්කල් වෙත නිකුත් කළ යුතු ය. ඒ සන්තකය භාරදීමේ ආඥාවේ සඳහන් දිනයකට පෙර දේපළෙහි සන්තකය මිල දී ගත් තැනැත්තාට හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් පත් කරනු ලැබූ වෙනත් යම් තැනැත්තකුට සන්තකය භාරදීම සඳහා ඒ දේපළෙහි පදිංචිව සිටින තැනැත්තා සහ ඔහුගෙන් යැපෙන්නන් සිටී නම් ඔවුන් ද ඒ දේපළේ හෝ එහි යම් කොටසක පදිංචි වෙනත් සෑම තැනැත්තකු ම නෙරපීම සඳහා ද ඒ රිට් ආඥාව මගින් නියම කළ යුතු අතර, බලය පැවරිය යුතු ය. පිස්කල් වෙත නිකුත් කරන ලද සන්තකය භාරදීමේ ආඥාව

ක්‍රියාත්මක කිරීමේ දී ආඥාව නිකුත් කළ දිසා අධිකරණයේ විධානවලට අනුකූලව ගොඩනැගිල්ලට ඇතුළු වීම සඳහා අවශ්‍ය බලය පිස්කල් හෝ පොලිස් නිලධරයා හෝ පිස්කල් හෝ නැතහොත් පොලිස් නිලධරයා විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් පාවිච්චි කරනු ලැබිය හැකි ය.

47. අධිකාරිය විසින් දේපළ මිල දී ගනු ලැබූ අවස්ථාවක, අධිකාරිය විසින් ඒ දේපළ නැවත විකිණීමට පෙර කවර හෝ අවස්ථාවක දී දේපළ විකුණනු ලැබුවේ යම් ණය මුදලක් සඳහා ද එම ණය මුදල සම්බන්ධයෙන් අයවිය යුතු මුදල් තහනම්ව ගැනීමේ සහ විකිණීමේ වියදම් ද ඇතුළු නියමිත අනුප්‍රමාණය නොඉක්මවන අනුප්‍රමාණයක් අනුව මුළු මුදල මත ගෙවිය යුතු පොළිය ද සමඟ ණයකරු හෝ ඔහු වෙනුවෙන් වෙනත් තැනැත්තකු විසින් ගෙවනු ලැබීමේ දී විකුණුම් සහතිකයේ සහතික පිටපතක් මත කරනු ලබන පිටසනක් මගින්, දේපළ විකිණීම අවලංගු කරනු ලැබිය හැකි ය. එවැනි පිටසනක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබූ විට එමගින් මෙම කොටස යටතේ වූ විකිණීම සිදු නොකළ ලෙස සලකා ඒ ඉඩම ණය ගැනුම්කරු වෙත නැවත සතු කරනු ලැබිය යුතු ය.

48. (1) විකුණනු ලැබූ දේපළ අධිකාරිය විසින් මිල දී ගනු ලැබ 47 වන වගන්තිය යටතේ විකිණීම අවලංගු කරනු නොලැබූ අවස්ථාවක, අධිකාරිය විසින් කවර හෝ විටක දී එම දේපළ නැවත විකිණිය හැකි අතර, සත්‍ය පිටපතක් බවට අධිකාරිය විසින් සහතික කරනු ලබන විකුණුම් සහතිකයේ පිටපතක් මත කරනු ලබන පිටසනක් මගින්, අධිකාරිය විසින් අත්කරගනු ලැබූ ඒ දේපළ පිළිබඳ සියලු අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා මිල දී ගත් තැනැත්තාට පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන පිටසනක් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබූ විට එසේ එහි නිශ්චිතව සඳහන් කළ යම් අයිතිවාසිකමක්, හිමිකමක් සහ සම්බන්ධතාවක් ඒ සටහනෙහි නිශ්චිතව දැක්වෙන මිල දී ගත් තැනැත්තා වෙත සතු විය යුතු ය.

49. තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව යම් උකස් බැඳුම්කරයක් මත අයවිය යුතු මුදල ආපසු අයකර ගැනීමෙන් 28 වන වගන්තියේ සිට 48 වන වගන්තිය දක්වා වූ වගන්තිවල අඩංගු කිසිවක් මගින් අධිකාරිය වළක්වනු ලබන බවට නොසැලකිය යුතු ය.



## VI වන කොටස

### අධිකාරියට අයත් මහල් නිවාස, වාසස්ථාන පහසුකම් හෝ වෙනත් යම් ගොඩනැගිල්ලක සන්තකය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආපසු ලබා ගැනීම

50. (1) යම් තැනැත්තකුගේ පදිංචිය සඳහා කුලී ගෙවීම මත හෝ අන්‍යාකාරයකට අධිකාරිය විසින් සපයා ඇති (මෙහි මින් මතු "ගොඩනැගිල්ල" යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම නිවසකට, මහල් නිවාසයකට, වාසස්ථාන පහසුකමකට හෝ වෙනත් යම් ගොඩනැගිල්ලකට මේ කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) යම් තැනැත්තකුගේ පදිංචිය සඳහා අධිකාරිය විසින් ගොඩනැගිල්ලක් සපයා ඇති අවස්ථාවක, ඒ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් මේ කොටසේ "ගෙවල් හිමියා" යන යෙදුමෙන් 19 වන වගන්තිය යටතේ පත්කර ඇති අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වන අතර, මේ කොටසේ "පදිංචිකරු" යන යෙදුමෙන් එහි පදිංචිව සිටින තැනැත්තා අදහස් වේ.

51. (1) මේ කොටස අදාළ වන යම් ගොඩනැගිල්ලක පදිංචිකරුට සහ ඔහුගෙන් යැපෙන්නන්ට ද ඒ ගොඩනැගිල්ලේ හෝ එහි යම් කොටසක පදිංචි වෙනත් සෑම තැනැත්තකුට ම පදිංචිකරු විසින් එම ගොඩනැගිල්ලේ පදිංචිය නීත්‍යනුකූල ලෙස අවසන් කිරීමේ දිනයට පසු එම ගොඩනැගිල්ලේ හෝ එහි කොටසක පදිංචි වී සිටීමට අයිතියක් නොමැති අතර, ඒ අනුව පදිංචිකරු විසින් ඒ දිනයේ දී ගොඩනැගිල්ලෙන් ඉවත් වී එහි සන්තකය ගෙවල් හිමියාට භාර දී පදිංචිකරුගෙන් යැපෙන්නන් සහ ඒ ඉඩමේ හෝ පරිශ්‍රයේ හෝ එහි යම් කොටසක පදිංචිව සිටින වෙනත් සෑම තැනැත්තකු සමඟ ඒ ගොඩනැගිල්ල පිහිටා තිබූ ඉඩමෙන් හෝ පරිශ්‍රයෙන් ඉවත්ව යා යුතු ය.

(2) මෙම කොටස අදාළ වන යම් ගොඩනැගිල්ලක ගෙවල් හිමියාගේ සේවයේ නියුක්තව සිටින යම් තැනැත්තකුගේ පදිංචිය සඳහා ගෙවල් හිමියා විසින් ඒ ගොඩනැගිල්ල ලබා දී ඇති අවස්ථාවක ඒ තැනැත්තාගේ සේවා නියුක්තිය නීත්‍යනුකූලව අවසන් වීමේ දිනයේ දී ඒ තැනැත්තා ඒ ගොඩනැගිල්ලේ පදිංචිව සිටීම මේ කොටසේ කාර්ය සඳහා නීත්‍යනුකූලව අවසන් වී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් යම් අවස්ථාවක දී පදිංචිකරුගේ සේවා නියුක්තිය දැනුම් දීමකින් තොරව අවසන් කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තාගේ සේවා නියුක්තිය නීත්‍යානුකූලව අවසන් කිරීමේ දිනය පිළිබඳව ඒ උපවගන්තියේ ඇති යම් සඳහනක් සේවා නියුක්තිය සැබැවින් අවසන් කළ දින සිට දින දාහතරකට පසුව වූ දිනයට කරන ලද සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

සන්තකය ලබා ගැනීම සඳහා සහ නෛසයි ආඥාවක් භාර දීම සඳහා අධිකරණය වෙත ඉල්ලුම් කිරීම.

52. (1) මේ කොටස අදාළ වන යම් ගොඩනැගිල්ලක පදිංචිකරු විසින් 51 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක, ගොඩනැගිල්ලේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා සහ ඒ ගොඩනැගිල්ලේ පදිංචිකරු, ඔහුගෙන් යැපෙන්නන් සහ ඒ ඉඩම හෝ පරිශ්‍රයේ හෝ එහි කොටසක පදිංචිව සිටින වෙනත් යම් තැනැත්තකු හෝ ඒ ගොඩනැගිල්ල පිහිටා ඇති ඒ ඉඩමෙන් හෝ පරිශ්‍රයෙන් නෙරපීම සඳහා ආයාචනා කරමින් ගොඩනැගිල්ල පිහිටි ප්‍රදේශය පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ගෙවල් හිමියා විසින් ඉල්ලීමක් ගොනු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය. ඒ සෑම ඉල්ලීමක් ම, පදිංචිකරුගේ පදිංචිය අවසන් වූ වේලාව සහ අවසන් වූ ආකාරය සඳහන් කරන දිවුරුම් ප්‍රකාශයක් මගින්, සනාථ කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් ලැබීමේ දී අධිකරණය විසින් පදිංචිකරු වෙත ඒ ඉල්ලීමේ සහ දිවුරුම් ප්‍රකාශයේ පිටපතක් සහ නෛසයි ආඥාවක් එම තැනැත්තා වෙත භාරදිය යුතු අතර—

(අ) ඒ ආඥාව භාර දෙන දිනයට පසුව එළඹෙන ලිත් මාස දෙකකට පසුව වූ දිනයක් නොවන්නා වූ ආඥාවේ සඳහන් දිනයක දී පෙනී සිටීමට ; සහ

(ආ) 51 වන වගන්තිය මගින් නියම කර ඇති ආකාරයට ගොඩනැගිල්ලේ සන්තකය ආපසු භාර දී ඔහුගේ යැපෙන්නන් සහ ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ හෝ පරිශ්‍රයේ හෝ එහි යම් කොටසක පදිංචි වෙනත් සෑම තැනැත්තකු ම සමඟ එම ඉඩමෙන් හෝ පරිශ්‍රයෙන් ඉවත්ව නොයා යුත්තේ මන්ද යන්න සඳහා හේතු දැක්වීමට,

නියම කළ යුතු ය.



(3) (2) වන උපවගන්තිය යටතේ වූ නෛසයි ආඥාවක් පිස්කල් විසින් හෝ පිස්කල් විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් පදිංචිකරු වෙත භාරදෙනු ලැබුවහොත් හෝ එසේ භාරදීමට නොහැකි අවස්ථාවක දී ඒ ආඥාව අදාළ වන ගොඩනැගිල්ලේ ප්‍රකටව පෙනෙන ස්ථානයක පිස්කල් හෝ ඉහත කී ආකාරයට ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් අලවනු ලැබුවහොත් ඒ නෛසයි ආඥාව පදිංචිකරු වෙත භාර දී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

නඩු විභාගය අඩාලව කල් තැබීම.

53. (1) මේ කොටස යටතේ නෛසයි ආඥාවක් භාර දෙනු ලැබූ පදිංචිකරුවකු ඒ ආඥාවේ සඳහන් දිනයක දී අධිකරණයට පැමිණ දිවුරුම් ප්‍රකාශයක් හෝ දිවුරුම මත හෝ ප්‍රතිඥා මත වූ ප්‍රකාශයක් මගින් නඩුව අඩාලව කල් තැබීමට අවශ්‍ය වන බවට අධිකරණයේ මතය වන යම් විත්තිවාචකයක් මතු කරනු ලැබුවහොත්, මතු කරනු ලබන විසඳිය යුතු කරුණ හෝ කරුණු අධිකරණය විසින් වහාම සමතයකට පත් කොට වාර්තාගත කළ යුතු අතර, නඩුවට අදාළ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන සාක්ෂි විභාග කිරීම සඳහා හැකිතාක් ඉක්මණින් දිනයක් නියම කළ යුතු අතර, එවැනි අවස්ථාවක පාර්ශ්වයන් විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි සෑම සාක්ෂිකරුවන් වෙතම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සිතාසි නිකුත් කරමින් එම සිතාසියේ සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී අධිකරණයට පැමිණෙන ලෙස දැනුම් දිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් නඩුවක් විභාග කිරීම සඳහා දිනයක් නියම කර ඇති අවස්ථාවක—

(අ) නඩුව අඩාලව කල් තැබීම සඳහා සියලු පාර්ශ්වයන් කැමැත්ත ප්‍රකාශ කරන්නේ නම් මිස ; හෝ

(ආ) නඩුවට අදාළ සිද්ධිමය කරුණු දන්නා සහ ඒවා ඔප්පු කිරීමේ හැකියාව ඇති සාක්ෂිකරුවකු වංක සහයෝගය හැර අන් හේතුවක් මත අධිකරණයට නොපැමිණ සිටීම හේතු කොට එම කල් තැබීම අවශ්‍ය බවට දිවුරුම් දීමේ හෝ ප්‍රතිඥා දීමේ ප්‍රකාශයක් මගින් හෝ දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කරනු ලබන සාක්ෂි මත අධිකරණය සෑහීමට පත් වන්නේ නම් මිස,

එම විභාග කිරීම වෙනත් පසු දිනයක් සඳහා නැවතත් අඩාලව කල්තබනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නඩුව විභාග කිරීම සඳහා නියම කළ දිනයේ දී හෝ (2) වන උපවගන්තිය යටතේ නඩු විභාගය අඩාලව කල් තැබිය හැකි යම් දිනයක් තිබේ නම් ඒ වෙනත් දිනයේ දී වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද මතු කරන ලද විසඳිය යුතු ප්‍රශ්න අධිකරණය විසින් විභාග කොට තීරණය කරනු ලැබිය යුතු අතර, ඒ මත නඩු තීන්දුව දෙනු ලැබිය යුතු ය.

නෙරපීමේ ආඥාව.

54. (1) මේ කොටස යටතේ නෙසයි ආඥාවක් භාර දී ඇති යම් පදිංචිකරුවකු ආඥාවේ සඳහන් දිනයේ දී හෝ මේ කොටස යටතේ නඩු විභාගය කල් තබනු ලැබිය හැකි වෙනත් යම් දිනයක අධිකරණය වෙත නොපැමිණ සිටින්නේ නම් හෝ පැමිණ සිට ආඥාවේ සඳහන් ගොඩනැගිල්ලේ සන්තකය 51 වන වගන්තිය මගින් නියම කර ඇති පරිදි භාර නොදී තමන්ගෙන් යැපෙන්නන් සහ ඒ ඉඩමේ හෝ පරිශ්‍රයේ නැතහොත් එහි යම් කොටසක පදිංචිව සිටින වෙනත් සෑම තැනැත්තකු සමඟ එම ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම හෝ පරිශ්‍රයෙන් ඉවත්ව යෑම සිදු නොකළේ ඇයි ද යන්න පිළිබඳව පිළිගත හැකි හා වලංගු හේතු දැක්වීමට අපොහොසත් වන්නේ නම් නෙසයි ආඥාව නියත තීන්දු ආඥාවක් බවට පත් කොට ඒ ඉඩමෙන් හෝ පරිශ්‍රයෙන් ඒ තැනැත්තා, ඔහුගේ යැපෙන්නන් සහ ඒ ඉඩමේ හෝ පරිශ්‍රයේ පදිංචිව සිටින වෙනත් සෑම තැනැත්තකු ම ඒ ඉඩමෙන් හෝ පරිශ්‍රයෙන් වහාම නෙරපන ලෙස නියම කරමින් අධිකරණය විසින් ආඥාවක් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් කරනු ලබන නෙරපීමේ ආඥාවකට එරෙහිව කිසිම අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය නොහැකි විය යුතු ය.

නෙරපීමේ ආඥාව අනුකූලව ක්‍රියා නොකිරීම.

55. (1) 54 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවකට අනුකූලව ක්‍රියා කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක ඉඩම් හිමියා විසින් කරනු ලබන ඉල්ලීමක් මත මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ ආඥාවෙන් බැඳී සිටින සියලු තැනැත්තන් ඒ ආඥාව අදාළ වන ඉඩමෙන් හෝ පරිශ්‍රයෙන් නෙරපා ඒ ඉඩමේ හෝ පරිශ්‍රයේ සන්තකය ඉඩම් හිමියාට භාරදීම සඳහා පිස්කල් වෙත හෝ පොලිස් නිලධරයකු වෙත සන්තකය ලබා ගැනීමේ රිට් ආඥාවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) නෙරපීමේ ආඥාව ක්‍රියාවේ යෙදවීම භාරව සිටින පිස්කල් හෝ පොලිස් නිලධරයා විසින් ඒ ආඥාව කරනු ලැබූ මහෙස්ත්‍රාත් අධිකරණයේ විධානයට අනුකූලව ක්‍රියා කර ඒ ආඥාව ක්‍රියාත්මක කළ ආකාරය පිළිබඳ නිසි වාර්තාවක් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.



(3) නෙරපීමේ ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ දී පිස්කල් හෝ පොලිස් නිලධරයා විසින් නැතහොත් පිස්කල් හෝ පොලිස් නිලධරයා විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් ආඥාව අදාළ වන ඉඩම හෝ පරිශ්‍රයට ඇතුළුවීම සඳහා සහ ආඥාවෙන් බැඳී සිටින යම් තැනැත්තකු නෙරපීම සඳහා සහ ආඥාව නිකුත් කළ මහෙස්ත්‍රාත් අධිකරණයේ විධානයට අනුකූලව ඉඩමේ හෝ පරිශ්‍රයේ සන්තකය භාරදීම සඳහා අවශ්‍ය විය හැකි යම් බලයක් පාවිච්චි කරනු ලැබිය හැකි ය.

පදිංචිවීමේ අයිතිය තහවුරු කිරීම පිළිබඳව ක්‍රියා කිරීම.

56. (1) මේ කොටසේ විධිවිධාන යටතේ ඉඩමකින් හෝ පරිශ්‍රයකින් හෝ ගොඩනැගිල්ලකින් හෝ නෙරපනු ලැබ ඇති යම් තැනැත්තකු විසින් හෝ එහි යම් නීත්‍යානුකූල පදිංචිකරුවකු බවට හිමිකම්පාන්නා වූ තැනැත්තකු විසින් හෝ ඒ ඉඩමේ හෝ පරිශ්‍රයේ පදිංචිය පිළිබඳ තම අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස නෙරපීමේ ආඥාවේ දින සිට මාස හයක් ඇතුළත ඉඩම් හිමියාට එරෙහිව නඩුවක් පවරනු ලැබීම මේ කොටසේ සඳහන් කිසිවක් මගින් වළක්වනු නොලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ තමා නෙරපනු ලැබූ ඉඩමක හෝ පරිශ්‍රයක පදිංචිව සිටීමට තමාට ඇති අයිතිය තහවුරු කිරීම සඳහා ඉඩම් හිමියාට එරෙහිව යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ නඩුවක් පවරනු ලැබූ අවස්ථාවක දී එම නඩුව එම තැනැත්තාගේ වාසියට තීරණය කරනු ලැබූ විටක එම ඉඩමේ සහ ගොඩනැගිල්ලේ සන්තකය භාරදීම නිසා තමාට සිදු වූ අලාභයක් සඳහා සාධාරණ වන්දි මුදලක් අයකර ගැනීමට එම තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය.

මේ කොටසේ විධිවිධාන බලපැවැත්විය යුතු බව.

57. වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද මේ කොටසේ විධිවිධාන බලාත්මක විය යුතු අතර ඒ අනුව මේ පනතේ මේ කොටසේ විධිවිධාන සහ වෙනත් යම් නීතියක විධිවිධාන අතර, යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇතිවුවහොත්, මේ පනතේ මේ කොටසේ විධිවිධාන බලපැවැත්විය යුතු ය :

එසේ වුව ද, යම් ඉඩමක හෝ පරිශ්‍රයක හෝ ගොඩනැගිල්ලක සන්තකය ආපසු ලබා ගැනීම සඳහා හෝ එහි අයිතිය ස්ථිර කිරීම සඳහා හෝ ඒ ඉඩම, පරිශ්‍රය හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් යම් සහනයක් ඉල්ලා සිටීම සඳහා හෝ වෙනත් යම් නීතියක විධිවිධාන යටතේ ක්‍රියා කිරීමට ඉඩම් හිමියකුට ඇති අයිතිවාසිකම්වලට මේ කොටසේ සඳහන් කිසිවක් මගින් අගතියක් සිදු නොවිය යුතු ය.

## VII වන කොටස

### සාමාන්‍ය

අමාත්‍යවරයාගේ විධාන.

58. (1) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරිය වෙත සාමාන්‍ය හෝ විශේෂ විධාන ලබාදිය හැකි අතර, ඒ විධාන අධිකාරිය විසින් ඉටු කරනු ලැබිය යුතු ය.

(2) (i) අධිකාරියේ දේපළ, ව්‍යාපාර සහ කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට අවශ්‍ය වන තොරතුරු ඔහුට ලබා දෙන ලෙසත්;

(ii) අධිකාරියේ අරමුණුවල වෙනස් වීම්, උගත් පාඩම් සහ පරදු දරන්නන්ගේ සහ ප්‍රතිලාභ ලබන්නන්ගේ අදහස් හා නිරීක්ෂණ ද පෙන්නුම් කරමින් අධිකාරියේ ජයග්‍රහණ පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව පිළියෙල කරන ලෙසත්, සෑම වර්ෂයකම ඔක්තෝබර් මස පළමුවන සඳුදා ලෝක ජනාවාස දිනය වශයෙන් නම් කර ඇති බව ජනතාව දැනුවත් කරන ලෙසත්,

අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරිය වෙත ලිඛිතව විධාන කළ හැකි ය.

[illegible]

59. අධිකාරිය විසින් හෝ එය වෙනුවෙන් හෝ අධිකාරියේ වාසියට හෝ ලියා අත්සන් කරනු ලබන යම් සාධන පත්‍රයක් හෝ ලේඛනයක් මත මුද්දර ගාස්තු ගෙවීමෙන් 2006 අංක 12 දරන මුද්දර ගාස්තු පනතේ විධිවිධාන මගින් විධිවිධාන සලසා ඇති ප්‍රමාණයට අධිකාරිය නිදහස් කරනු ලැබිය යුතු ය.

නියෝග.

60. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ බලාත්මක කිරීමේ කාර්ය සඳහා හෝ මේ පනත මගින් නියම කර ඇති යම් කරුණක් සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ පනත මගින් බලය පවරා ඇති යම් කරුණක් සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.



(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

[illegible]

61. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා හෝ ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් ලිඛිතව බලය පවරන ලද වෙනත් නිලධරයකු යම් සාධාරණ වේලාවක දී යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළු වී අධිකාරියේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා නැතහොත් අධිකාරියේ යම් බලයක් ක්‍රියාත්මක කිරීමට නැතහොත් යම් කර්තව්‍යයක් ඉටු කිරීමට ප්‍රාථමික වූ හෝ ආනුෂංගික වූ හෝ යම් සමීක්ෂණයක්, පරීක්ෂණයක් හෝ විමර්ශනයක් සිදු කිරීමේ කාර්ය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය යම් ක්‍රියාවක් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

සියලු නිලධරයන් ආදිය රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

62. අධිකාරියේ සියලු අධ්‍යක්ෂවරයන්, නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා සහ එහි අර්ථානුකූලව රජයේ නිලධරයන් විය යුතු ය.

අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

63. (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

[illegible]

64. (1) යම් අධිකරණයක් ඉදිරිපිට අධිකාරිය විසින් හෝ එයට එරෙහිව ගෙන එනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවන ලද යම් ගාස්තුවක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත අධිකාරියේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට එරෙහිව පවරනු ලැබූ සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සිදු කර ඇත්තේ සද්භාවයෙන් බවට අධිකරණය තීරණය කරන්නේ නම් සහ ඒ වියදම් එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඒ තැනැත්තා විසින් අයකර ගනු ලැබුවහොත් මිස, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

65\. (1) මේ පනත මගින් රීති සෑදීමට නියම කර ඇති සියලු හෝ යම් කරුණක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ අධිකාරිය විසින් සාදනු ලබන කවර හෝ රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරන තුරු බලාත්මක නොවිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් ඒ යම් රීතියක් අනුමත කරනු ලැබීමෙන් පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

66\. මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝග හෝ රීති උල්ලංඝනය කරන හෝ ඒ නියෝග හෝ රීතිවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් එක්දහසකට වැඩි නොවන දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

67\. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

68\. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ —

"නාගරික ජනාවාස ප්‍රදේශය" යන්නෙන්, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ නාගරික සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශයක් අදහස් වන අතර, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී වැඩසටහන්වලට සම්බන්ධතාවක් දක්වන වෙනත් ප්‍රදේශ ද ඇතුළත් වේ.